// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2398/18 - 2024 අගෝස්තු මස 21 වැනි බදාදා - 2024.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. පසුව සංශෝධිත 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධානවල අර්ථය තුළ "ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාරයක්" ලෙස ද නම් කර ඇති බලයලත් තැනැත්තෙකු විසින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට එවැනි බලයලත් තැනැත්තෙකුගේ

අනුමත ඕනෑම ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා, ප්‍රාග්ධන/ ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ඇතුළුව භාණ්ඩ ආනයනය කිරීමේ දී, එම භාණ්ඩ බලයලත් තැනැත්තාගේ නමට පවරනු ලැබ ඇත්තේ නම් පමණක්, ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ ගුවන්තොටුපළකට පැමිණීමට පෙර ලබාගෙන ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශය මත, විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර ලබාදිය යුතු ය. විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ එවැනි භාණ්ඩ ආනයනය කිරීම සඳහා ගෙවීම් බලයලත් තැනැත්තා විසින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන තුළ උත්පාදනය කරන ලද විදේශ විනිමය මගින් පියවිය යුතුය.

4. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ බලපත්‍රලාභී බැංකු වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

5. ඕනෑම අනුමත තැනැත්තෙකු විසින් ඉහත රෙගුලාසි අංක 3 උල්ලංඝනය කරමින් සිදු කරන ලද ඕනෑම භාණ්ඩ ආනයන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් විමසිය යුතුය.

6. මෙම රෙගුලාසි 2025 අගෝස්තු මස 20 දක්වා පමණක් බලාත්මක වේ.

EOG 08-0285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.